# මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ

## 'බ්ලොසම්ස්' අවුරුදු 18 සපුරයි

## ඕගනයට පණ පොවන ඉංජිනේරුවරයා - විජිත අමරසේකර



මෙල්බන් නුවර සංගීත කණ්ඩායම් අතර කැපී පෙනෙන 'බ්ලොසම්ස්' සංගීත කන්ඩායමේ නායක විජිත අමරසේකර මහතා පසුගිය දිනෙක මට හමුවුණා. ජනප්‍රිය මිත්‍රශීලී නිහතමානී කලාකරුවකු ලෙස මෙල්බන් ශ්‍රී ලාංකික සමාජයේ කැපී පෙනන විජිත මුහුණට මුහුණ සමග එක් වුණේ මෙලෙසයි.

ශ්‍රීනාත්
බොහෝ අය සිතනවා ඉංජිනේරු වෛද්‍ය වැනි වෘත්තිකයන් සංගීතය වැනි සෞම්‍ය කලාවකට යොමු වෙනවා අඩුයි කියලා. මේ ගැන ඔබ මොනවද හිතන්නෙ?

විජිත
ඇත්තටම අපි ඉගෙනගන්න කාලේ මෙවැනි තත්වයක් තිබුණා. නමුත් දැන් මේ තත්වය හුඟක් වෙනස් වෙලා. දැන් මෙවැනි වෘත්තිකයන් බොහෝ කලා ක්ෂෙත්‍රවල නියැලී ඉන්නවා. මම පොඩි කාලේ ඉඳන්ම වෙනස් විදිහකට හිතුවේ. කුඩා කාලයේ සිටම සංගීතයට මගේ දැඩි ඇල්මක් තිබුණා. එයට මට අපේ පවුලේ උදවියගෙන් විශාල සහයක් ලැබුණා.

මම මුලින්ම සංගීත කණ්ඩායමක් සමග වැඩ කළේ 1975 දී. ඒ තමයි මොරටුවේ 'සිලෙක්ෂන්' සංගීත කණ්ඩායම. එතකොට මං විශ්ව විද්‍යාලයේ ඉන්න අවධිය. මේ කාලයේ ජනප්‍රිය සංගීත කණ්ඩායම් බොහොමයක් තිබුණා. මොරටුවේම බොහෝ සංගීත කණ්ඩායම් තිබුණා. නමුත් මේ සංගීත කණ්ඩායම් අතර අපේ සංගීත කණ්ඩායම ගායකයන්ට පසුබිම් සංගීතය සපයමින් සන්දර්ශන වලට සහභාගී වුණා.

ඒ කාලයේ මට මතක් වෙනවා මම ප්‍රාථ මික වයිසී 10 වැනි ප්‍රාථමික මට්ටමේ තිබුණ ඕගනයක් තමයි වාදනය කළේ. අද ඒ ගැන හිතනකොටත් පුදුමයි. මේ වකවාණුව වන විට තියෙන ඕගන් එක්ක සසඳනකොට.

ශ්‍රීනාත්
ඔබ ඕස්ට්‍රේලියාවට එනකල්ම හිටියෙ මේ සංගීත කණ්ඩායම සමගද?

විජිත
නැහැ.. මම අධ්‍යාපනය හමාර කර මගේ පළමුවෙනි රැකියාව හැටියට ඔරුවල වානේ සංස්ථාවේ සහකාර ඉංජිනේරුවරයෙක් ලෙස රැකියාව කරන්න සිදුවීම නිසා ඒ සංගීත කණ්ඩායමෙන් ඉවත් වන්න සිදුවුනා. ඉන්පස්සෙ මම ඔරුවල 'යුනිවර්ස්' සංගීත කණ්ඩායමට සම්බන්ධ වුණා.

ශ්‍රීනාත්
ඔබ ඕස්ට්‍රේලියාවට ආවේ මොන කාලෙ ද?

විජිත
1988 දී. එහිදී මුලින්ම මේ අවස්ථාවේ මතක් කරන්න කැමතියි දයා සිල්වා මහතා ව. 'ඩින්කම් ලංකා' නමින් දයා සිල්වා මහතා ආරම්භ කළ සංගීත කන්ඩායමට මෙහි ආව කාලයේම මම සම්බන්ධ වුණා. ඒ කාලයේ මෙහි ආව ප්‍රවීණ ශිල්පීන් සියලු දෙනාටම සංගීතය සැපයුවේ අපි. මට මතක් වෙනවා 1989 ක්ලැරන්ස් විජේවර්ධන මහතා සහ එම් එස් ප්‍රනාන්දු මහතාට පසුබිම් සංගීතය සැපයූ ආකාරය.

ශ්‍රීනාත්
ඔබේ සංගීත කන්ඩායම ආරම්භ කළේ මොන කාලෙද?

විජිත
මගේ සංගීත කණ්ඩායම 'බ්ලොසම්ස්' ආරම්භ කළේ 1990 දී. එදා සිට තවමත් මම මේ සංගීත කණ්ඩායම පවත්වාගෙන යනවා. අපි ජනප්‍රිය ශිල්පීන් විශාල පිරිසකට සංගීතය සපයා තිබෙනවා. මාත් එක්ක සුනිල් වීරසූරිය, කැමිලස් හෙට්ටිගේ, අතුල , දිලීප, මයිකල්, රම්‍යා, වැනි ශිල්පීන් වරින් වර එක්වුණා. මේ වන විට නිත්‍ය සාමාජිකයන් හැටියට මාත් සමග සුනිල් වීරසූරිය, චන්දිම ජයතිලක, දිලීප අමරසේන, මලිත් පතිරණ, කුමාර කරුනාතිලක සහ නිත්‍ය ගායිකාවන් ලෙස සෙව්වන්දිකා අබේරත්න, රන්මිණී විජේසිංහ සහභාගි වෙනවා, ඒ එක්කම ලබන මාසයේ 21 වන දා පවත්වන සීත රෑ වසන්තේ සංගීත ප්‍රසංග ය සඳහා අප සමග රෝහිත උඩුවෙලත් සහභාගි වෙනවා.

ශ්‍රීනාත්
සැප්තැම්බර් 21 වන දා පවත්වන සීත රෑ වසන්තේ සංගීත ප්‍රසංගයේ විශේෂත්වයක් තිබෙනවාද?
විජිත
ඔව්.. අපේ සංගීත කණ්ඩායමට වසර 18ක් පිරීම නිමිත්තෙන් අපි මේ සංගීත ප්‍රසංග ය පවත්වනවා. මේ ප්‍රසංගය පවත්වන්නේ වෙස්ලි කොලෙජ් හි ඇඩම්ස් තියටර් එකේ දීයි. සවස 5.30 ට. සංගීත් නිපුන් සනත් නන්දසිරි මහතා සහ මල්කාන්ති නන්දසිරි මහත්මිය මේ ප්‍රසංගය ට සහභාගි වෙනවා.

ශ්‍රීනාත්
ඔබේ අලුත් සංගත තැටිය නිකුත් වන්නේ කවදාද?

විජිත
ඒ ගැන අහපු එක ගැන සතුටුයි. මගේ පළමුවන සංගත තැටිය නිකුත් කරලා දැන් වසර ගණනාවක් වෙලා තිබෙනවා. අලුත් ආරේ සංගත තැටියක් කරන්න මගේ බලාපොරොත්තුවක් තිබෙනවා. මම වේගවත් ගමණක් යන කෙනෙක් නෙවෙයි. ඒ නිසා මෙයත් හෙමින් හෙමින් කෙරෙනවා.

ශ්‍රීනාත්
හැම සති අන්තයකම ඔබේ සංගීත කන්ඩායම කොහේ හෝ ප්‍රසංගයකට සහභාගි වෙනවා. අනෙත් වැඩත් සමග මෙහි තිබෙන අවිවේකයත් සමග කොහොමද මේවට කාලය සොයාගන්නෙ?

විජිත
මේ වෙලාවේ මට මතක් වෙන්නෙ මගේ මේ සියලු දේවල් වලට මගේ පිටිපස්සෙන් ඉන්න මගේ පවුලේ උදවිය. මගෙන් කෙරන්න ඕනෙ යම් යම් යුතුකම් වගකීම් වල බර කරට අරන් ඉන්නෙ මගේ බිරිඳ ශ්‍යාමලිකා. පුතා දිලීප හා දුව චින්තනී. මේ අය නිසා තමයි මට මේ වැඩ වලට කාලය ලැබිලා තියෙන්නෙ. ඒ ගැන මතක් කරන්නම ඕනෙ. මගේ යම් කිසි සාර්ථකත්වයක් තිබෙනවා නම් ඒ පිටිපස්සෙ ඉන්නෙ මගේ පුවලේ උදවියයි.

ශ්‍රීනාත්
ඔබේ බිරිඳත් ගීත ගායනා කරනවා නේද?

විජිත
ඇයටත් හොඳට ගීත ගායනා කරන්න පුලුවන්. මගේ පුතාත් මා සමග අපේ සංගීත කණ්ඩායමේ ශිල්පියකු ලෙස එක්වෙලා ඉන්නවා.

ශ්‍රීනාත්
ඔබේ මේ ගමනේ අමතක නොවන දෙයක් තිබෙනවාදඃ

විජිත
2006 සෙරෙන්ඩිබ් සම්මාන උළෙලේ දී සම්මානයට පාත්‍ර වීම අමතක වෙන්නෙ නැහැ.

ශ්‍රීනාත්
ඔබට මේ ගමන යන්නට උදව් කළ අය කව්ද?

විජිත
නම් වශයෙන් කියන්න ගියොත් විශාල පිරිසක් ඉන්නවා. කෙටියෙන් කිව්වොත් මෙල්බන් නුවර සිටින සියලුම ශ්‍රී ලාංකිකයන් අපට උදව් කළා. ඒ සියලු දෙනාටම මේ වෙලාවේ මා ස්තුති කරන්න කැමතියි. මා ආරාධනා කර සිටිනවා සැප්තැම්බර් 21 වන දින පැවැත්වෙන සීත රෑ වසන්තේ ප්‍රසංග යට සහභාගි වී අපත් සමග අපේ සංගීත කණ්ඩායමේ 18 වන සංවත්සරය සමරන්න එක් වන්න කියා. ඔබට නවමු වූ අත්දැකීමක් විඳින්නට හැකිවේවි.

ශ්‍රීනාත්
ඔබේ සංගීත කණ්ඩායමටත් සැප්තැම්බර් 21 වනදා පවත්වන ප්‍රසංගයටත් සන්නස වෙනුවෙන් අපි සුබ පතනවා.

ඒ එක්කම අපි සැප්තැම්බර් 21 වන දා විජිත සමග සීත රෑ වසන්තේ ප්‍රසංගයට එක් වෙමු.











